# සාමාන්‍ය සමයේ විසිසත්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ජෝවෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෝවෙල් 3: 12-21

"අස්වැන්න පැසී ඇති බැවින් දැකැත්ත යොදන්න."

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. "ජාතීහු සැරසී ජෙහෝෂාපාත් මිටියාවතට නැගිට එත්වා!
මන්ද, අවට්න් සිටින සකල ජාතීන් විනිශ්චය කිරීමට මම එහි අසුන් ගන්නෙමි. අස්වැන්න පැසී ඇති බැවින් දැකැත්ත යොදන්න.
මිදි යන්ත්‍ර පිරී ඇති බැවින් ඇතුළට ගොස් පාගන්න. ඔවුන්ගේ නපුරුකම් අධික බැවින් බඳුන් උතුරා යයි. කෝටි සංඛ්‍යාත මහා ජනකායක් තීන්දු දීමේ මිටියාවතේ රැස් වී සිටිති. තීන්දු දීමේ මිටියාවතෙහි සමිඳුන්ගේ දවස ළංව ඇත. ඉර හඳ අඳුරු වී ඇත. තරුවල දීප්තිය නිවී ගොස් ඇත.

සමිඳාණෝ සියොන්හි ගර්ජනා කරන සේක. ජෙරුසලමේ සිට හඬ නගන සේක. අහසත් පොළොවත් කම්පා වනු ඇත. එහෙත් සමිඳාණෝ සිය සෙනඟට රක්ෂා ස්ථානයක් වන සේක. ඉශ්රායෙල් ජනයාට බලකොටුවක් වන සේක. ඉශ්රායෙල් ජනයෙනි, මෙසේ මා ඔබේ දෙවි සමිඳුන් බව ඔබ දැනගන්නහු ය. මම සියොන් නම් මාගේ ශුද්ධ කන්දේ වැඩ වාසය කරමි. ජෙරුසලම ශුද්ධ නගරයක් වන්නේය. විජාතීහු මින්පසු එය මැදින් නොයන්නාහු ය.

ඒ කාලයේ දී කඳුවලින් මිදියුස වැස්සෙනු ඇත. හෙල්වලින් කිරි ගලා යනු ඇත. ජුදාහි සියලු ඇළ දොළවල වතුර පිරෙනු ඇත.
සමිඳුන්ගේ මාළිගාවෙන් උල්පත් නික්ම ෂිට්ටිම් මිටියාවතට වතුර දෙනු ඇත. ජුදා වැසියන්ට බලහත්කාරකම් කොට, ඒ රටේ මිනිසුන් මරා දැමූ නිසා මිසර දේශය පාළුකරයක් වන්නේය.
ජුදාහි සදහට ම ද ජෙරුසලමේ පරම්පරාවෙන් පරම්පරාවට ද සෙනඟ වාසය කරනු ඇත.
මන්ද, සමිඳාණෝ සියොන් කන්දේ වැඩ වාසය කරනු ඇත.
සියලු වරදකරුවන්ට මම දඬුවම් දෙමි. ඔවුන්ගේ ලේ වැගිරීමේ වරද ගැන මම පළිගනිමි.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **97: 1-2, 5-6, 11-12**

පිළිතුර: දැහැමියෝ සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙත්වා!

ගීය:

සමිඳාණෝ රජකම් කරන සේක. මිහිතලය ප්‍රීති වේවා!
දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේවා!
වලාකුළු සහ අඳුර එතුමන් වට කර සිටින්නේ ය.
දැහැමිකම සහ යුක්තිය එතුමන්ගේ සිහසුනේ පදනම ය.

කඳු හෙල් සමිඳාණන් දැක ඉටි මෙන් උණු වන්නේ ය.
මුළු මිහිතලය ද සමිඳුන් දැක එසේ වන්නේ ය.
දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ කරන්නේ ය.
සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය නරඹන්නෝ ය.

දැහැමියන් මත එළිය බබළයි. යහපත් අය මත සතුට දිළිසෙයි.
පින්වත්නි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙන්වා!
එතුමන්ගේ සුවිශුද්ධ භාවය සිහිකොට එතුමන්ට ප්‍රශංසා කරන්වා!

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින්නෝ භාග්‍යවන්තයෝ ය.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 27-28

"ඔබ දැරූ කුසය භාග්‍යවන්ත ය. දෙවියන් වහන්සේගේ වචන අසා
පිළිපදින අය ඊටත් වඩා භාග්‍යවන්ත ය."

ජේසුස් වහන්සේ සමූහයාට කතා කරද්දී, සමූහයා කෙරෙන් එක් ස්ත්‍රියක් හඬ නගා "ඔබ දැරූ කුසය ද ඔබට කිරි දුන් පියයුරු ද භාග්‍යවන්තය"යි උන්වහන්සේට කීවාය. උන්වහන්සේ ද "එසේය. දෙවියන් වහන්සේගේ වචනය අසා පිළිපදින අය ඊටත් වඩා භාග්‍යවන්තය"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.